**ඇමුණුම I**

## රහස්‍යභාවය පිළිබඳ ප්‍රකාශය

('අපි', 'අප විසින්', 'අපේ', 'ලංකා බැංකුව' හෝ 'බැංකුව' යනුවෙන් සඳහන් කරනු ලබන) ලංකා බැංකුව, පෞද්ගලික තොරතුරුවල රහස්‍යභාවය සහ සුරක්ෂිතභාවය ආරක්ෂා කරගැනීම සඳහා බැඳී සිටී. ඔබ ලංකා බැංකු වෙබ් අඩවිය වෙත පිවිසෙන විට හෝ අපගේ සේවාවන් ලබාගන්නා විට, අප විසින් ඔබේ තොරතුරු එකතු කරන, භාවිත කරන, හෙළිදරව් කරන සහ ආරක්ෂා කරන ආකාරය මෙම රහස්‍යභාවය පිළිබඳ ප්‍රකාශය මගින් විස්තර කරනු ලැබේ. අප සේවාවන් වෙත ප්‍රවේශවීමෙන් හෝ සේවාවන් ලබාගැනීමෙන් මෙම රහස්‍යභාවය පිළිබඳ ප්‍රකාශයේ විස්තර කර ඇති ක්‍රියාමාර්ගවලට ඔබ විසින් කැමැත්ත පළකිරීම සිදුවේ.

මෙම ප්‍රකාශය පුරාවට 'පෞද්ගලික දත්ත' හෝ 'පෞද්ගලික තොරතුරු' යන්නෙන් ඔබේ නම, ලිපිනය සහ හැඳුනුම්පත් අංකය හඳුන්වන වන නමුත් එමගින් එම තොරතුරු පමණක් ම අදහස් නොවේ. ඔබේ පෞද්ගලික දත්තවලට අදාළ කටයුතු එනම්, පරිහරණය කිරීම, එකතු කිරීම, ආරක්ෂා කිරීම සහ ගබඩා කිරීම 'දත්ත සැකසීම' යනුවෙන් හඳුන්වනු ලැබේ.

### මෙම රහස්‍යභාවය පිළිබඳ ප්‍රකාශය මගින් පහත කරුණු සපයනු ලැබේ.

1. **2022 අංක 9 දරන දත්ත ආරක්ෂණ පනතට අනුව දත්ත එකතු කිරීම සහ සැකසීම පිළිබඳ විශ්ලේෂණයක්**

   විශේෂ හෝ සංවේදී දත්ත ඇතුළු ඕනෑම ආකාරයේ පෞද්ගලික දත්තයක් එකතු කිරීමට, භාවිත කිරීමට සහ හෙළිදරව් කිරීමට අදාළව මෙම රහස්‍යභාවය පිළිබඳ ප්‍රකාශය සකස් කර ඇත. එය බැංකුව සමග මීට පෙර ගනුදෙනුකාර සම්බන්ධතාවක් ඇති තැනැත්තන්ට ද අදාළ වේ.

2. **අප තබාගන්නා, එකතු කරන සහ සකසන තොරතුරු**

   ඔබේ නම, සම්බන්ධ කරගත හැකි තොරතුරු, හඳුනාගැනීමේ තොරතුරු, උපන් දිනය, මූල්‍ය තොරතුරු, ගනුදෙනු පිළිබඳ දත්ත, ගෙවීම්පත පිළිබඳ තොරතුරු, ස්ත්‍රී-පුරුෂ භාවය, ජාතිකත්වය, තුන්වන පාර්ශවයන්ගෙන් සහ පොදු අවකාශයෙන් (Public domain) ලද තොරතුරු, සාමාන්‍ය ව්‍යාපාර කටයුතු සඳහා අවශ්‍ය වන අප වෙබ් අඩවියෙන්, කුකීස් (Cookies) මාර්ගයෙන් සහ අප විද්‍යුත් බැංකු සේවාවන් භාවිතයෙන් එකතුකරන තොරතුරු වැනි ඍජුව හෝ වක්‍රව ඔබ අපට ලබාදෙන පෞද්ගලික දත්ත අප විසින් තබා ගැනීම, එකතු කිරීම සහ සැකසීම කරනු ලැබේ. ඔබට බැංකු සේවාවන් ඉක්මනින් හා පහසුවෙන් සිදුකරගැනීමට මෙය අත්‍යවශ්‍ය වේ.

3. **අප ඔබේ පෞද්ගලික තොරතුරු භාවිතකරන ආකාරය**

   ඔබේ ගිණුම් කළමනාකරණය, බැංකු සේවා සැපයීම, ගනුදෙනු සැකසීම, අප නිමැවුම් සහ සේවා සකස්කොට වටිනාකම නිශ්චය කර ඒවා වැඩි දියුණු කිරීම, අප නිමැවුම් සහ සේවා අලෙවි කිරීම,

අවදානම් තත්ත්වයන් කළමනාකරණය කිරීම, ගිණුම්කරණය, විගණන සහ වෙනත් අභ්‍යන්තර කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා සහ නෛතික සහ නියාමන අවශ්‍යතා, අදාළ කර්මාන්ත ප්‍රමිතීන්, ගිවිසුම්ගත වගකීම්වලට අනුකූලවීම සඳහා ඔබේ පෞද්ගලික තොරතුරු අප විසින් භාවිතකරනු ලැබේ. තවද, ගිණුම් පිළිබඳ යාවත්කාලීන තොරතුරු අදාළ ප්‍රවර්ධනයන් සහ සේවාවට අදාළ වෙනත් නිවේදන ඔබ වෙත යැවීම වැනි සන්නිවේදන කාර්යයන් සඳහා ද ඔබේ පෞද්ගලික දත්ත අප විසින් භාවිත කරනු ලැබේ.

**ඔබේ පෞද්ගලික දත්ත සැකසීමේ අරමුණු**

ඔබ විසින් ඉල්ලාසිටින නිමැවුම් සහ සේවා ලබාදීමට ලංකා බැංකුවේ අපි ඇපකැප වී සිටින්නෙමු. අපගේ ගිවිසුම්ගත වගකීම් සපුරාලීම සහතික කිරීමට සහ අපට හැකි උපරිමයෙන් ඔබට අවශ්‍ය සේවාව ඒ ආකාරයෙන්ම සැපයීම සඳහා පහත දැක්වෙන අරමුණුවලට සීමා නොවී එවැනි විවිධ වූ අත්‍යවශ්‍ය කරුණු සඳහා අප විසින් ඔබේ පෞද්ගලික දත්ත සකසනු ලැබේ.

1. **ඔබේ ඉල්ලීම් සැකසීම**

   නිමැවුම් සහ සේවා සඳහා වන ඉල්ලීම් මෙහෙයවීම සඳහා, ගෙවීම් සැකසීම සඳහා, ගනුදෙනු සිදුකිරීම සඳහා සහ ඔබේ උපදෙස් හෝ ඉල්ලීම් කඩිනමින් සහ නිවැරදිව ඉටුකරදීම සඳහා අප විසින් ඔබේ දත්ත සකසනු ලැබේ. බැංකුව පිළිබඳ හොඳ ප්‍රතිරූපයක් ඇතිකිරීම සඳහා විද්‍යුත් බැංකු සේවා ලබාදීම ඇතුළු අප සපයන සෑම සේවාවක් ම මීට ඇතුළත් වේ.

2. **යෝග්‍යතාව තක්සේරු කිරීම**

   ඔබේ සුවිශේෂී අවශ්‍යතා හා වුවමනා වෙනුවෙන් අප නිමැවුම් හා සේවා සඳහා අප විසින් පිරිනමනු ලබන ප්‍රදානයන් ලබාගැනීමට ඔබ යෝග්‍ය වන්නේ ද යන වග අප විසින් තක්සේරු කරනු ලැබේ.

3. **ණය තක්සේරුකරණය**

   වගකිව යුතු ණයදීමේ ක්‍රම සහ මූල්‍ය ස්ථාවරත්වය සහතික කරගැනීම සඳහා ණය පරීක්ෂාවන් සහ ණය සීමාවන් පැනවීම ඇතුළු ණය තක්සේරුකරණය අප විසින් සිදුකරනු ලැබේ.

4. **මෙහෙයුම් සහ සංඛ්‍යානමය කාර්යයන්**

   අප සේවාවන් ඉහළ නැංවීමට මෙන්ම නියාමන අවශ්‍යතා ඵලදායී ලෙස සපුරාලීම සඳහා ද ඔබේ දත්ත, මෙහෙයුම් සහ සංඛ්‍යානමය කාර්ය සඳහා යොදාගනු ලැබේ.

5. **බැංකු සබඳතා සහ සුරක්ෂිතභාවය**

   අප විසින් බැංකු සබඳතා සහ ගිණුම් ඇති කොට, පවත්වාගෙන යනු ලබන අතර ඒවා කළමනාකරණය කරනු ලබන අතර ඔබේ සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව සහතිකකිරීම සඳහා අප විසින් බැංකු ශාඛා සහ ATM යන්ත්‍ර අධීක්ෂණය කිරීම ද කරනු ලැබේ.

**ඔබේ පෞද්ගලික දත්ත හෙළිදරව් කිරීම**

අප සේවාවන් ඔබ වෙත ලබාදීමට සහ ගිවිසුම්ගත වගකීම් ඉටුකිරීමට පහත දැක්වෙන පාර්ශ්වයන් වෙත ඔබේ පෞද්ගලික දත්ත හෙළිදරව් කරනු ලැබේ.

1. **වෘත්තීය උපදේශකවරු, හවුල්කරුවන් සහ සේවා සපයන්නන්**

   අප සේවාවන් ඉහළම ප්‍රමිතීන්ට අනුව ලබාදෙන බව සහතික කර ගැනීම සඳහා හෙළිදරව් නොකරන ගිවිසුම්/රහස්‍යභාවය පිළිබඳ වගකීම්වලට යටත්ව, අප විසින් ඔබේ පෞද්ගලික දත්ත වෘත්තීය උපදේශකවරු, උපදේශකවරු, ණය ශ්‍රේණිගතකිරීමේ ආයතන (credit rating agencies), රක්ෂණකරුවන්, රක්ෂණ තැරැව්කරුවන්, විගණකවරු, තුන්වන පාර්ශ්ව සේවා සපයන්නන්, නියෝජිතයන්, අනුගාමී බැංකු සහ ණය පරීක්ෂණයන් සිදුකිරීම සඳහා මූල්‍ය ආයතන සහ විනිමය ආයතන, සහ බැංකුවේ ව්‍යාපාර මෙහෙයුම්වලට සහාය දක්වන ස්වාධීන කොන්ත්‍රාත්කරුවන් සමග හුවමාරු කරගනු ලැබේ.

2. **ව්‍යාපාර සංධාන හවුල්කරුවන්**

   ඔබේ අවශ්‍යතා ඉටුකිරීම සඳහා පවතින විකල්පයන් වැඩිකරමින් ඔබේ ප්‍රතිලාභය පිණිස නිමැවුම් හෝ සේවාවන් පිරිනමන ව්‍යාපාර සංධාන හවුල්කරුවන් සමග අප විසින් ඔබේ පෞද්ගලික දත්ත හුවමාරු කරගනු ලැබේ.

3. **කාඩ්පත් සංගමයේ සාමාජිකයන් සහ වෙළෙඳුන්**

   ගෙවීම් කාඩ්පත් ගනුදෙනු සඳහා පහසුකම් සැලසීමට අප විසින් ඔබේ පෞද්ගලික දත්ත වෙළෙඳුන් වෙත හෝ කාඩ්පත් සංගමයේ සාමාජිකයන් වෙත හෙළිදරව් කරනු ලැබේ.

4. **නීතීඥවරයන්, නෛතික නියෝජිතයන් සහ පවුලේ සාමාජිකයන්**

   ඇටර්නි බලපත්‍රයක් හරහා ඔබ විසින් පත්කරන ලද ඔබේ නීතීඥවරයා වෙත ඔබේ පෞද්ගලික දත්ත අප විසින් හෙළිදරව් කරනු ලැබේ.

   ළමයකු සම්බන්ධයෙන් වන විට, අප විසින් ඔහුගේ හෝ ඇයගේ පෞද්ගලික දත්ත දෙමාපියන් වෙත හෝ නීතිමය භාරකරු වෙත හෙළිදරව් කරනු ලැබේ.

   ඔබේ මරණයේදී හෝ දීර්ඝකාලීන දුබලතාවකදී, ඔබ වෙනුවෙන් කටයුතු කිරීම සඳහා ඔබේ නෛතික නියෝජිතයන්, නීතිමය උරුමකරුවන් සහ පවුලේ ළගම සාමාජිකයන් සමග ඔබේ පෞද්ගලික දත්ත හුවමාරු කරගනු ලැබේ.

5. **නීතිවලට සහ අධිකාරයන්ට අනුකූලවීම**

   අප විසින් ඔබේ පෞද්ගලික දත්ත, යම් අධිකරණයක්, විනිශ්චයාධිකාරයක්, නීතිය බලාත්මකකිරීමේ නියෝජ්‍යාතනයක්, විනිමය මණ්ඩලයක්, බදු අධිකාරයක් හෝ (වරදක් පිළිබඳ විමර්ශනය කරන යම් අධිකාරයක් ඇතුළු) වෙනත් යම් අධිකාරයක් වෙත හෙළිදරව් කරනු ලැබේ.

   තවද, දේශීය හෝ විදේශීය නීති හෝ නියෝග මගින් හෙළිදරව් කිරීමට ඉඩදෙන හෝ නියම කරනු ලබන ඔබේ පෞද්ගලික දත්ත යම් තැනැත්තෙකු වෙත හෙළිදරව් කරනු ලැබේ.

6. **ඒකාබද්ධවීම් සහ අත්කර ගන්නන්**

අප සතු සියලු ව්‍යාපාර හෝ වත්කම් හෝ එම ව්‍යාපාරවල හෝ වත්කම්වල යම් කොටසක් ඒකාබද්ධ කිරීමක්, අත්කර ගැනීමක් හෝ විකිණීම ඇතුළු ආයතනික වෙනසකට සම්බන්ධ ඔබේ පෞද්ගලික තොරතුරු හුවමාරු කර ගැනීමේ අයිතිය අප සතුය.

මෙම හෙළිදරව් කිරීම් ඕනෑම අධිකරණ බල ප්‍රදේශයකදී සිදු විය හැකි අතර ඒවා උපරිම සැලකිල්ලෙන් සහ අදාළ නීති සහ නියෝගයන්ට අනුකූලව ක්‍රියාත්මක කරනු ලැබේ.

## ඔබේ පෞද්ගලික දත්තවල සුරක්ෂිතභාවය

ඔබේ පෞද්ගලික දත්තවල සුරක්ෂිතභාවය සහතිකකිරීම ලංකා බැංකුවේ අපගේ ප්‍රධානතම කාර්‍ය වන්නේය. ඔබේ තොරතුරු කුමන ස්ථානයක ගබඩා කර තබන්නේද නැතහොත් ඒවා කුමන ස්ථානයක් වෙත මාරු කර ඇත්තේද යන වග නොතකා ඒවා සුරක්ෂිතව තිබෙන බව ඔබ විශ්වාසයෙන් සිටීම අපට වැදගත් වේ. ඔබේ දත්තවල ආරක්ෂාවට අප ප්‍රමුඛත්වය දෙන ආකාරය පහතින් දැක්වේ.

1. **තාක්ෂණික සහ සංවිධානමය පියවර**

ඔබේ පෞද්ගලික දත්ත ආරක්ෂාකිරීම සඳහා තාක්ෂණික සහ සංවිධානමය ආරක්ෂක පියවර පිළිබඳ වැදගත් සහ පිළිගත් ප්‍රමිතීන් අප ක්‍රියාත්මකකර තිබේ. ඔබේ තොරතුරු වෙත අනවසර ප්‍රවේශවීම්, තොරතුරු හෙළිදරව්කිරීම, වෙනස්කිරීම සහ විනාශකිරීම වැනි දේ වලින් ඔබේ තොරතුරු ආරක්ෂාකර ගැනීම සඳහා මෙම පියවර සකස් කර තිබේ.

2. **බාහිර සේවා සපයන්නන්**

බාහිර සේවා සපයන්නන් සමග කටයුතු කිරීමේදී ලංකා බැංකුව විසින් අනුමත දැඩි ආරක්ෂක ප්‍රමිතීන්ට ඔවුන් අනුගතවන බව අප විසින් සහතික කරනු ලැබේ. රහස්‍යභාවය පිළිබඳ නියාමකවරු/අධිකාරීන් විසින් නියමකරනු ලබන ගිවිසුම්ගත විධිවිධාන හරහා මෙම ප්‍රමිතීන් අප විසින් බලාත්මකකරනු ලබන අතර ඒවාට අනුකූලවන බව සහතික කිරීම සඳහා නිරන්තර අධීක්ෂණය සිදුකරනු ලැබේ.

3. **ජාත්‍යන්තර හුවමාරු කිරීම් සහ අවදානම් තත්ත්වයන්**

පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ විධිවිධානවලට සහ අදාළ නියෝගවලට අනුගත වෙමින් ශ්‍රී ලංකාවට සාපේක්ෂව, දත්ත ආරක්ෂණ නීති පනවා නොමැති රටවල් ද ඇතුළු ශ්‍රී ලංකාවෙන් බැහැර ප්‍රදේශවලට ද ඔබේ පෞද්ගලික දත්ත හුවමාරු කරනු ලැබේ. ඔබේ පෞද්ගලික දත්ත තිබෙන ස්ථානය කුමක් වුවත් ඒවා ඉතා සුරක්ෂිතව පවතින බව සහතික කිරීම සඳහා අප විසින් හැකි සෑම පියවරක්ම ගනු ලැබේ.

4. **අන්තර්ජාල අවදානම්**

සුදුසු ආරක්ෂණ පියවර අප විසින් ගනු ලැබුවද ඔබේ පෞද්ගලික දත්ත වෙත ප්‍රවේශවීමේ හැකියාව සහ අවසර නොලත් තුන්වන පාර්ශවයන් විසින් කරනුලබන මැදිහත්වීම් ඇතුළු අන්තර්ජාලය හරහා දත්ත හුවමාරු කිරීමේදී ඊට ආවේණික වූ අවදානම් පවතී.

5. **ජාත්‍යන්තර දත්ත හුවමාරු කිරීම**
   දත්ත යවන්නා සහ ලබන්නා එකම රටක සිටියද අන්තර්ජාලය හරහා හුවමාරු වන තොරතුරු විවිධ රටවල් අතර බෙදා යවන අතර, සමහර රටවල රහස්‍යභාවය පිළිබඳ සහ දත්ත සුරැකීමේ නීති ඔබ වාසය කරන රටේ නීතිවලට වඩා ලිහිල් විය හැකිය.

**ඔබේ ආරක්ෂාව වෙනුවෙන් අපේ කැපවීම**

මෙම අභියෝග හමුවේ ඉහත කී අවදානම් අවමකිරීමට අපි උත්සාහ කරමු. දත්ත හුවමාරු කිරීමේදී සහ ගබඩා කිරීමේදී ඔබේ දත්ත ආරක්ෂාකිරීම සඳහා ආරක්ෂාව සම්බන්ධයෙන් වන නවතම තාක්ෂණයන් සහ ප්‍රොටෝකෝල අප විසින් යොදා ගැනේ.

අප ඔබේ පෞද්ගලික දත්ත පිළිබඳ රහස්‍යභාවය සහ අවංකභාවය පවත්වාගෙන යාමට අපේක්ෂාකරන අතර ඒ පිළිබඳ ඔබ අප වෙත තබා ඇති විශ්වාසය තවදුරටත් රැකගැනීමට අපි නොසැලෙන කැපවීමෙන් කටයුතු කරමු.

ඔබේ පෞද්ගලික දත්තවල ආරක්ෂාව සම්බන්ධයෙන් යම් ගැටළු පවතින්නේ නම්, කරුණාකර අපව අමතන්න. ඔබේ රහස්‍යභාවය සහ තෘප්තිමත්භාවය ආරක්ෂා කිරීම අපගේ පරම යුතුකම වේ.

## ඔබේ දත්ත අප වෙත තබා ගන්නා කාලසීමාව

නෛතික හා නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව අත්‍යවශ්‍ය කටයුතු මෙන්ම මෙහෙයුම් අවශ්‍යතා සඳහා අප විසින් ඔබේ පෞද්ගලික දත්ත තබාගනු ලැබේ. දත්ත අප වෙත තබාගන්නා කාලය ඔබ අවසන් වරට අප හා ගනුදෙනු කළ දින සිට **වසර දොළහක කාලසීමාවක්** දක්වා දිවෙන නමුත් මීට අදාළ නීති මගින් එය දීර්ඝකිරීමට නියම කළහොත් එසේ කිරීමට ද සිදුවේ.

## අලෙවි කටයුතු පිළිබඳ දැනුම්දීම්

අප ඔබේ විශ්වාසය සහ රහස්‍යභාවය සුරකින අතර අප නිමැවුම් සහ සේවා පිළිබඳ ඔබ දැනුවත් වී සිටීම අවශ්‍ය වන බැවින් ඔබේ පෞද්ගලික දත්ත පහත දැක්වෙන නිශ්චිත කාරණා සඳහා ද යොදාගනු ලැබේ.

1. **අප සේවාවන් වැඩි දියුණු කිරීම.**
   අලෙවි පර්යේෂණ සහ සමීක්ෂණ පැවැත්වීමෙන් අපට ඔබේ අවශ්‍යතා සහ අභිරුචීන් දැනගත හැකි වන අතර එමගින් ඔබේ අභිලාෂයන්ට අනුකූලව අප නිමැවුම් හා සේවාවන් වැඩි දියුණු කිරීම කළ හැකි වේ.

2. **ප්‍රවර්ධන කටයුතු සහ වෙනත් කටයුතුවල නිරත වීම**
   ප්‍රවර්ධන කටයුතු, තරග සහ දිනුම් ඇදීම් වැනි අලෙවි කාර්යයන් සඳහා අප විසින් ඔබේ දත්ත යොදාගනු ලැබේ. එමගින් ඔබ වෙත උද්යෝගිමත් අවස්ථා සහ අගනා පිරිනැමීම් ලබාදීමට හැකිවේ.

### අලෙවි කටයුතු පිළිබඳ දැනුම්දීම් ඔබ විසින් පාලනය කිරීම

අප ඔබේ අභිරුචීන්ට මුල්තැන ලබාදෙන බැවින් අලෙවි කටයුතු පිළිබඳ පුවත් හෝ ලිපිලේඛන ඔබ වෙත නොඑවන ලෙස දැනුම් දෙන්නේ නම් ඔබේ කැමැත්ත පරිදි එය සිදුවනු ඇත. අලෙවි කටයුතු පිළිබඳ නිවේදන ඔබ ලබාගන්නේද නැද්ද යන වග තීරණය කිරීම ඔබ සතු අයිතියක් වන අතර එය ඔබේ කැමැත්ත පරිදි සිදු කර ගැනීමට ඔබේ ශාඛාව වෙත යාමට කටයුතු කරන්න.

තවද, ඔබේ අභිරුචීන්ට ප්‍රමුඛස්ථානය දීමට අප කටයුතු කරන බව සිහි තබා ගන්න.

### ඔබේ අභිරුචීන් වෙනස්වීම

අලෙවි කටයුතු පිළිබඳ මීට පෙර ඔබ විසින් ලද කරුණු හෝ වෙනයම් ප්‍රවර්ධන හෝ පර්යේෂණාත්මක කරුණු තවදුරටත් අවශ්‍ය නොවේ නම්, ඔබේ ඉල්ලීම එපරිදි සිදුවනු ඇත. කෙසේ වුවද, වාර්තා තබාගැනීමේ අරමුණින් පමණක් ඔබේ තීරණය පිළිබඳ අප වාර්තාකර තබන අතර ඔබේ කැමැත්තට ගරු කරමින් ඉදිරියේදී යම් දැනුම්දීම් ඔබ වෙත සිදු නොකරනු ලැබේ.

## ඔබේ විද්‍යුත් සන්නිවේදනයන් අධීක්ෂණය කිරීම

හුදෙක් නෛතික බැඳීම් හා අභ්‍යන්තර ප්‍රතිපත්තිවලට දැඩිව අනුකූලවීමේ අරමුණින් ඉහළ අනුකූලතා ප්‍රමිතීන්ට හා නීති සීමාවන්ට අනුගතව, ඔබ හා අප අතර ඇතිවන විද්‍යුත් සන්නිවේදනයන් අප අධීක්ෂණය කරනු ලැබේ.

ඔබ හා අප අතර ඇතිවන ගනුදෙනුවල විශ්වසනීයත්ව තහවුරු කරමින් ආරක්ෂිත හා සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම, විද්‍යුත් සන්නිවේදනයන් අධීක්ෂණය කිරීමෙන් අපේක්ෂාකෙරේ. අප සේවාවන් හි අවංකභාවය සහ නෛතිකභාවය තහවුරු කිරීමෙහිලා එක්ව කටයුතු කිරීමේදී එය තේරුම්ගෙන ඔබ ලබාදෙන සහයෝගය ඇගයිය යුතු වේ.

### රහස්‍යභාවය පිළිබඳ ඔබේ අයිතීන්

ඔබේ රහස්‍යභාවය අපට ඉතා වැදගත් වන බැවින් ඔබේ පෞද්ගලික දත්ත යම් පාලනයකට යටත්ව පවතින බව තහවුරු කරන අතර අදාළ නීතීන්ට, නියෝගයන්ට සහ බැංකු ක්ෂේත්‍රයේ මාර්ගෝපදේශයන්ට අනුකූලව පහත දැක්වෙන අයිතීන් ඔබ සතුවේ.

1. **ප්‍රවේශය**

   ඔබේ පෞද්ගලික දත්ත පිළිබඳ පිටපතක් ලබාගැනීම ඔබගේ අයිතියකි. යම් අවස්ථානුගත කරුණු යටතේ නීතියෙන් අවසරදෙනු ලබන ගාස්තුවක් මේ සඳහා අයකරනු ලැබේ.

2. **නිවැරදි කිරීම හෝ අවසන් කිරීම**

   කිසිදු ප්‍රමාදයකින් තොරව දත්ත නිවැරදිව හා යාවත්කාලීනව තබාගැනීම සඳහා අප විසින් ඔබේ වැරදි හෝ යල්පැන ගිය පෞද්ගලික දත්ත නිවැරදි කරනු ලැබේ.

ඒ අනුව, ඔබේ පෞද්ගලික දත්ත නිවැරදි කළ යුතු වන්නේ නම්, ඒ පිළිබද ඔබේ ශාඛාව දැනුවත් කිරීමෙන් එය පහසුවෙන් විසඳාගත හැකිය.

3. **මකා දැමීම**

   තවදුරටත් දත්ත වාර්තාකර තැබීම අවශ්‍ය වන බවට පවත්නා නීතියකින් විධානකරනු නොලැබුවහොත් පමණක් ඔබේ පෞද්ගලික දත්ත මකා දමන ලෙස ඉල්ලා සිටිය හැකිය.

## පැමිණිලි විසඳීම

ඔබේ පෞද්ගලික දත්ත සැකසීම පිළිබඳ ඔබේ ඉල්ලීම් අප විසින් වැදගත් කොට සලකනු ලබන අතර එය සිදුවන ආකාරය පිළිබඳ ඔබ අතෘප්තියට පත්වේ නම් හා ඒ සම්බන්ධ පැමිණිලි කළ යුතු වන්නේ නම්, පහත දැක්වෙන පියවර අනුගමනය කිරීමට වගබලා ගන්න.

1. ශාඛා මට්ටමින් විසඳුම් ලබාදීම.

   ප්‍රථමයෙන්ම ඔබේ ශාඛාව සමග එම පැමිණිල්ල පිළිබඳ සාකච්ඡා කිරීම අප විසින් නිර්දේශ කරන අතර ඒ පිළිබඳ සෘජුව කටයුතු කිරීමට ඔවුනට හැකියාව ඇත.

2. ලංකා බැංකුවේ දත්ත ආරක්ෂාකිරීමේ නිලධාරි

   සම්බන්ධ කරගත හැකි තොරතුරු

   වැඩිදුර තොරතුරු සඳහා dpo@boc.lk යන ලිපිනයට විද්‍යුත් පණිවිඩයක් එවන්න.

   ඔබේ ලිඛිත ඉල්ලීම් - දත්ත ආරක්ෂාකිරීමේ නිලධාරි
   11 වන මහල
   ලංකා බැංකුව
   ප්‍රධාන කාර්යාලය
   කොළඹ 01

   යන ලිපියන වෙත යොමු කළ හැකිය.

   ඔබේ ගැටළු නිසි ලෙස කඩිනම්න් විසඳාලීමට අප කැපවෙන අතර එම ක්‍රියාවලිය පුරාවට ඔබට අපගේ සහයෝගය ලැබෙනු ඇත.

3. දත්ත ආරක්ෂණ අධිකාරිය

   තවද, දත්ත ආරක්ෂණ අධිකාරිය වෙත පැමිණිල්ලක් ගොනු කිරීමට ද ඔබට අයිතිය ඇත.

## රහස්‍යභාවය පිළිබඳ අපගේ ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම

ලංකා බැංකුවේ අප, ඔබේ පෞද්ගලික දත්ත ආරක්ෂාකිරීමට ප්‍රමුඛස්ථානය ලබාදී ඇත. ඔබේ දත්ත මෙහෙයවන ආකාරය පිළිබඳ ඔබව දැනුවත්කිරීමට රහස්‍යභාවය පිළිබඳ ප්‍රතිපත්තිය කාලානුරූපීව යාවත්කාලීන වේ. එහි සිදුවන යම් යම් වෙනස්කම් හෝ සංශෝධන පිළිබඳ දැනුවත්වීමට අප වෙබ් අඩවිය වෙත නිතර පිවිසීමට ඔබට උපදෙස් ලබාදේ.

අවසන් වරට 2024.01.12 වන දින යාවත්කාලීන කරන ලදි.

## ඈඳුතු වෙබ් අඩවි ප්‍රතික්ෂේපණය (Linked Websites Disclaimer)

රහස්‍යභාවය පිළිබඳ අප සතු ප්‍රතිපත්තිය අප කාර්යයන්ට සහ සේවාවන්ට පමණක් විශේෂ වන අතර ලංකා බැංකුවේ දැන්වීම්, අන්තර්ජාලයේ දර්ශනය වන තුන්වන පාර්ශවයේ වෙනත් වෙබ් අඩවි වෙත ප්‍රචාරය කර නොමැති බවත් අප විසින් ක්‍රියාත්මක නොකරන හෝ අපගේ පාලනයෙන් තොර ඈඳුතු තුන්වන පාර්ශවයේ වෙබ් අඩවිවලට ද එය අදාළ නොවන බවත් ඔබ විසින් දැනගත යුතුය.

දී ඇති Links හරහා බාහිර වෙබ් අඩවි වෙත පිවිසීමේදී රහස්‍යභාවය පිළිබඳ ඔවුන් විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග අප සතු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් බව සිහියේ තබා ගන්න.